සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

S3120

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 02 යි

නම / பெயர் / Name: ........................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

සැලකිය යුතුයි

- 1 කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න
- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

## I කොටස

01. කොළ පැහැතිය, ස්වයංපෝෂි වේ, ශ්වසනය කරයි, වර්ධනය වේ, තම වර්ගයා බෝ කරයි, ඉහත ලක්ෂණ සියල්ල අයත් ජීවියා වන්නේ,
    1. ගොයම් මැස්සා ය. 2. තණකොළ පෙත්තා ය. 3. ගොයම් ගස ය. 4. ගිරවා ය.

02. ළදරු සූප්පු සහ අත් ආවරණ වැනි ද්‍රව්‍ය සෑදීමට රබර් යොදාගන්නේ රබර් සතු කුමන ගුණය නිසා ද?
    1. භංගුරතාවය 2. ආඝාත්‍යතාවය 3. ප්‍රත්‍යාස්ථ බව 4. සුවිකාර්ය බව

03. තාප විදුලි බලාගාරවල තල බමර කැරකැවීමට අවශ්‍ය ශක්තිය ලබා ගන්නා ශක්ති ප්‍රභවය කුමක්ද?
    1. මුහුදු රළ 2. සුළඟ 3. න්‍යෂ්ටික ද්‍රව්‍ය 4. ගල් අඟුරු

04. සිසුන් පිරිසක් විද්‍යාගාරයේදී A, B, C යන ද්‍රව්‍ය තුනක් සම්බන්ධව සිදුකළ පරීක්ෂණවල නිරීක්ෂණ පහත වගුවේ දැක්වේ.

| ද්‍රව්‍යය | හැඩය | පරිමාව |
|---|---|---|
| A | නිශ්චිත හැඩයක් නැත | නිශ්චිත පරිමාවක් ඇත |
| B | නිශ්චිත හැඩයක් ඇත | නිශ්චිත පරිමාවක් ඇත |
| C | නිශ්චිත හැඩයක් නැත | නිශ්චිත පරිමාවක් නැත |

මෙහි A, B, C සඳහා යොදා ගත් ද්‍රව්‍ය විය හැක්කේ කුමක්ද?


| | A | B | C |
|---|---|---|---|
| 01 | සබන් කැටය | ජලය | වාතය |
| 02 | ජලය | සබන් කැටය | වාතය |
| 03 | වාතය | සබන් කැටය | ජලය |
| 04 | ජලය | වාතය | සබන් කැටය |

05. පරිසරයේ උෂ්ණත්වය වෙනස් වුවද සිරුරේ උෂ්ණත්වය නොවෙනස්ව පවතින සතුන් ඇතුලත් පිළිතුර තෝරන්න.
    1. සර්පයා, ගෙම්බා 2. මිනිසා, ගිරවා 3. කටුස්සා, කෘමීන් 4. මාළුවා, කබරගොයා



CamScanner


06.




ඉහත දැක්වෙන පරිපථ අතරින් කුමන පරිපථයේ බල්බය නොදැල්වේ ද?

1. A  2. B  3. C  4. D

07. රූපයේ දැක්වෙන ක්‍රියාකාරකම මගින් සිසුන් නිරීක්ෂණය කිරීමට බලාපොරොත්තු වනු ඇත්තේ,




1. ජලයේ ලවණතාව පරීක්ෂා කිරීම වේ.
2. ජලය පවතින අවස්ථා හඳුනා ගැනීම වේ.
3. ජලය පවතින විවිධ ආකාර හඳුනා ගැනීම වේ.
4. වායුගෝලයේ ජල වාෂ්ප පවතිදැයි පරීක්ෂා කිරීම වේ.

08. රූපයේ පෙන්වා ඇති කේතලයේ තිබූ ජලය සම්පූර්ණයෙන්ම බේසමට දැමූ විට,




1. ජලයේ පරිමාව වෙනස් වේ.
2. ජලයේ හැඩය වෙනස් වේ.
3. ජලය පවතින අවස්ථාව වෙනස් වේ.
4. ජලයේ ස්කන්ධය වෙනස් වේ.

09. බොහෝ විට නාය යාමට ලක්වන්නේ,

1. වෙරළාසන්න ප්‍රදේශය යි.  2. තැනිතලා ප්‍රදේශය යි.
3. කඳු සහිත බෑවුම් ප්‍රදේශය යි.  4. වනාන්තර සහිත ප්‍රදේශය යි.

10. එකම ශාක වර්ගයක් මත යැපීම නිසා වඳ වී යාමේ තර්ජනයට ලක් වී ඇති සත්ත්වයා,

1. මුවා ය.  2. පැන්ඩා ය.  3. කැන්ගරුවා ය.  4. හාවා ය.

11.




ඉහත චුම්බක වර්ග පිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

1. බූරප චුම්බක, වලයාකාර චුම්බක, පෙති චුම්බක, U හැඩති චුම්බක
2. U හැඩති චුම්බක, වලයාකාර චුම්බක, බූරප චුම්බක, පෙති චුම්බක
3. බූරප චුම්බක, වලයාකාර චුම්බක, U හැඩති චුම්බක, පෙති චුම්බක
4. බූරප චුම්බක, පෙති චුම්බක, U හැඩති චුම්බක, වලයාකාර චුම්බක

12. පහත ප්‍රකාශ වලින් නිවැරදි වගන්ති වන්නේ,


a බටනලාව හඬ නිපදවන ක්‍රමයට ගොක් කොළ නලාවේ හඬ නිපදවයි
b බෙරයක හඬ නිපදවන ආකාරයට සර්පිනාවක හඬ නිපදවයි
c ගිටාරයක හඬ නිපදවන ආකාරයට වීණාවක හඬ නිපදවයි

1. a හා b පමණි.  2. a හා c පමණි.  3. b හා c පමණි.  4. a,b හා c තුනම නිවැරදි වේ.



CamScanner


13. මෙහි ඉදිරියෙන් ඇති රූපයෙන් පෙන්වා ඇත්තේ කුමක් ද?




1. අනිලමානය කි.
2. සුළං දිශා දර්ශකය කි.
3. ආර්ද්‍රතාමානය කි.
4. උෂ්ණත්වමානය කි.


14. ශාකවල පමණක් සිදුවන ක්‍රියාවලියක් වන්නේ,
1. ඔක්සිජන් වායුව ලබාගෙන කාබන්ඩයොක්සයිඩ් වායුව පිටවීම.
2. කාබන්ඩයොක්සයිඩ් වායුව ලබාගෙන ඔක්සිජන් පිටවීම.
3. ඔක්සිජන් හා ආලෝක ශක්තිය භාවිතයෙන් ආහාර නිපදවීම
4. ග්ලූකෝස් වැය කරමින් කාබන්ඩයොක්සයිඩ් වායුව නිපදවීම.

15. පෙනීම ආදර්ශනය කිරීමට යොදා ගන්නා මෙම ඇටවුම මගින් නිගමනය කළ හැක්කේ,




1. පෙනීමට සිදුරක් අවශ්‍ය බවයි.
2. පෙනීමට වස්තුවක් අවශ්‍ය බවයි.
3. පෙනීමට ඇස අවශ්‍ය බවයි.
4. පෙනීමට ආලෝකය අවශ්‍ය බවයි.

16. රූපයේ පෙන්වා ඇති ක්‍රියාකාරකමේදී දණ්ඩ චුම්බකය කම්බි දඟරය තුළ එහා මෙහා කරන විට,





1. තාප ශක්තිය නිපදවයි.
2. විද්‍යුත් ශක්තිය නිපදවයි.
3. චුම්බක ශක්තිය නිපදවයි.
4. ආලෝක ශක්තිය නිපදවයි.

17. අපගේ ප්‍රධාන ශක්ති ප්‍රභවය වන්නේ,
1. සූර්යයා ය.
2. දර ය.
3. ගල් අඟුරු ය.
4. පෙට්‍රෝලියම් වායු ය.

18. ප්‍රසාරණය, එදිනෙදා ජීවිතයේ භාවිතා නොවන අවස්ථාව වන්නේ පහත කවරක් ද?
1. කරත්ත රෝදයට පට්ටමක් සවි කිරීම.
2. රේල් පීලි අතර හිඩැසක් තැබීම.
3. විදුරු බෝතලයක කටට තදින් සවි වූ ලෝහ මූඩියක් ගැලවීම.
4. යකඩ ගේට්ටුවක් සවි කිරීම.

19. නිදහසේ එල්ලන ලද චුම්බක 2ක් එකිනෙකට ලං කළ අවස්ථා තුනක් A, B, C ලෙස දැක්වේ.

A
B
C




A, B, C හි දැකිය හැකි නිරීක්ෂණ පිළිවෙළින්,
1. විකර්ෂණය, විකර්ෂණය, ආකර්ෂණය වේ.
2. විකර්ෂණය, ආකර්ෂණය, විකර්ෂණය වේ.
3. ආකර්ෂණය, ආකර්ෂණය, විකර්ෂණය වේ.
4. ආකර්ෂණය, විකර්ෂණය, විකර්ෂණය වේ.

20. ගෝලීය උණුසුම ඉහළ යාම නිසා සිදු <u>නොවන</u> ක්‍රියාවලිය වන්නේ,
1. නාය යෑම ය.
2. හිම කඳු දියවීම ය.
3. සාගර ජල මට්ටම ඉහළ යාම ය.
4. කුඩා දූපත් ජලයෙන් යටවීම ය.




CamScanner

# II කොටස

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4ක් තෝරාගෙන පිළිතුරු සපයන්න

01. A. කඳුකර ප්‍රදේශයක පිහිටි සමන්ගේ නිවස පිටුපස දිය පිහිල්ලක් හා කුඩා පොකුණක් ඇත.




මෙම කුඩා පොකුණ ආශ්‍රිතව විවිධ සතුන් හා ශාක දැක ගත හැක.

i. පොකුණ තුළ හා ඒ අවට පරිසරයේ රූපය තුළ දක්නට ලැබෙන ජීවීන් ගෙන් පමණක් පුරුක් 3 ක ආහාර දාමයක් ලියන්න. (ලකුණු 03)

ii. එම ආහාර දාමයේ නිෂ්පාදකයා නම් කරන්න. (ලකුණු 01)

iii. ආහාර දාමයක සෑම පුරුකක්ම වැදගත් වන්නේ ඇයි? (ලකුණු 02)

iv. ඉහත පොකුණ ආශ්‍රිතව සිටින ජීවීන්ගෙන්


a ශාක භක්ෂක

b මාංශ භක්ෂක

c සර්ව භක්ෂක සතෙකු බැගින් තෝරා ලියන්න. (ලකුණු 03)

v. ශාක තුළ සූර්යාලෝකය ඇතිවිට සිදුවන විශේෂ ක්‍රියාවලිය කුමක්ද? (ලකුණු 01)

B. ඉහත රූපයේ ඇති ශක්ති ප්‍රභවයකින් විද්‍යුත් ශක්තිය නිපදවීමට සිසුන් විසින් පහත ඇටවුම සකස් කරන ලදී.




i. ඉහත නිර්මාණය ක්‍රියාත්මක කිරීමට යොදාගත් ශක්ති ප්‍රභවය කුමක්ද? (ලකුණු 01)

ii. මෙහි විද්‍යුත් ශක්තිය නිපදවීමට යොදාගත් B උපාංගය නම් කරන්න. (ලකුණු 01)

iii. මෙහි විද්‍යුත් ශක්තිය නිපදවී ඇති බව හඳුනා ගන්නේ කෙසේද? (ලකුණු 01)

iv. බල්බයේ දීප්තිය වැඩි කිරීමට සිදුකළ හැකි වෙනස් කම් 2 ක් ලියන්න. (ලකුණු 02)

v. ශ්‍රී ලංකාවේ සුළං විදුලි බලාගාරයක් පිහිටි ස්ථානයක් නම් කරන්න. (ලකුණු 01)


(මුළු ලකුණු 16)




CamScanner

02. A. සිසුන් නිර්මාණය කළ සරල කෝෂයක රූප සටහනක් පහත දක්වා ඇත.

i. $x$ ලෙස යොදාගත් ද්‍රාවණය නම් කරන්න. (ලකුණු 01)
ii. $y$ ලෙස යොදාගත් ලෝහය නම් කරන්න. (ලකුණු 01)
iii. ඉහත කෝෂය ක්‍රියාත්මක වන විට සින්ක් තහඩුව හා $y$ තහඩුව අසල දුටු නිරීක්ෂණ 2 ක් ලියන්න. (ලකුණු 02)




B.





63175

i. ඉහත පරිපථය සම්මත සංකේත යොදා නැවත අඳින්න. (ලකුණු 04)
ii. $x$ උපකරණයේ ප්‍රධාන කාර්යය ලියන්න. (ලකුණු 02)
iii. මෙහි විදුලි ධාරාව ගලායන්නේ A සිට B වද? B සිට A ට ද? (ලකුණු 01)


(මුළු ලකුණු 11)

03. A. තාපය සම්බන්ධ සිදුකළ සිසු ක්‍රියාකාරකමක් පහත දැක්වේ.




i. වයින් ස්ප්‍රිත්තු ලාම්පුව මගින් ජලයට ලබාදෙන්නේ කුමන ශක්ති ප්‍රභේදය ද? (ලකුණු 01)
ii. වයින් ස්ප්‍රිත්තු ලාම්පුව දල්වා ටික වේලාවකින් ඔබට උෂ්ණත්වමානයේ කුමන නිරීක්ෂණයක් ලැබෙයි ද? (ලකුණු 02)
iii. ජලය නටන විට උෂ්ණත්වමානයේ පාඨාංකය කිය ද? (ලකුණු 01)
iv. ජලය නටන විට ජලයේ සිදුවන අවස්ථා විපර්යාසය ලියන්න. (ලකුණු 02)

B. තාපන ඵලයේ ප්‍රයෝජන පරීක්ෂා කිරීම සඳහා සකසන ලද ඇටවුමක රූපයක් මෙහි දැක්වේ.




i. ඔබ සකස් කළ ඉහත ඇටවුම නම් කරන්න. (ලකුණු 01)
ii. මෙම ඇටවුමේ ජල කරාමයට සම්බන්ධ කරන්නේ ප්ලාස්ටික් නළයේ ඉහළ කෙළවර a ද? පහළ කෙළවර b ද? (ලකුණු 02)
iii. PVC බටයෙත්, නළයෙත්, පෙට්ටිය තුළ ඇලුමිනියම් කොළයෙත්, කළු තීන්ත ආලේප කරන්නේ කුමක් සඳහා ද? (ලකුණු 02)

(මුළු ලකුණු 11)

04. A. සිසුවෙක් ළඟ, පහත සඳහන් ද්‍රව්‍ය එකතුවක් සහිත බඳුනක් ඇති අතර එහි අඩංගු ද්‍රව්‍ය ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


බැලූනයක්, අවර්ණ පොලිතීන් කොළයක්, අඟුරු කැබැල්ලක්, තඹ කම්බිය, මල් සහිත පාට තෙල් කඩදාසි, පුළුන්.

i. .............................. පාරදෘශ්‍ය ද්‍රව්‍යයකි.
ii. .............................. භංගුරතාව පෙන්වයි.
iii. .............................. තන්‍යතාවයක් ඇත.
iv. .............................. පාරභාසක ද්‍රව්‍යයකි.
v. .............................. ප්‍රත්‍යස්ථතාවයක් සහිතය.
vi. .............................. මෘදු වයනයක් ඇත. (ලකුණු 06)



CamScanner

B. සුදුසු වචන යොදා හිස් තැන් පුරවන්න.





(ලකුණු 05)

(මුළු ලකුණු 11)

05. A. 6 ශ්‍රේණියේ සිසුවියන් තම විද්‍යා සටහන් පොතේ, උෂ්ණත්වමානයක් භාවිතා කර දිනක් තුළ තම පන්ති කාමරය ඉදිරිපස මිදුලේ උෂ්ණත්වය පිළිබඳ වගුවක් සකස් කරන ලදී.

| වේලාව | උෂ්ණත්වය °C |
|---|---|
| පෙ.ව 7.30 | 25 °C |
| පෙ.ව 9.30 | 29 °C |
| පෙ.ව 11.30 | 30 °C |
| ප.ව 1.30 | 32 °C |

i. වගුවේ දැක්වෙන තොරතුරු ඇතුළත් කර පහත ප්‍රස්තාරය සම්පූර්ණ කරන්න. (ලකුණු 03)





ii. අඩුම උෂ්ණත්වය සටහන් වන්නේ දවසේ කුමන වේලාවේ ද? (ලකුණු 01)

iii. වැඩිම උෂ්ණත්වය සටහන් වන්නේ දවසේ කුමන වේලාවේ ද? (ලකුණු 01)

iv. එම උෂ්ණත්ව අතර වෙනස සෙල්සියස් අංශක කීය ද? (ලකුණු 01)

B. කාලගුණ විද්‍යා තොරතුරු ලබා ගැනීමට භාවිතා කරෙන උපකරණ කිහිපයක රූප සටහන් පහත දැක්වේ.




A B C

පහත i, ii, iii කොටස් සඳහා නිවැරදි අක්ෂර ලියන්න.

i. සුළඟේ වේගය මැනීමට භාවිතා කරයි.

ii. වර්ෂාපතනය මැනීමට භාවිතා කරයි.

iii. සුළඟ හමන දිශාව සොයා ගැනීමට භාවිතා කරයි. (ලකුණු 03)

iv. මෙම අවස්ථාවේ සුළං හමන්නේ කුමන දිශාවට ද? (ලකුණු 01)

v. වර්ෂාපතනය මනින ඒකකය කුමක් ද? (ලකුණු 01)

(මුළු ලකුණු 11)



CamScanner

06. A. චුම්බක පිළිබඳ ක්‍රියාකාරකමෙ දී සිසුන් දණ්ඩ චුම්බකය ඇමුණුම් කටු ගොඩක තබන ලදී.

i. දණ්ඩ චුම්බකය ඇද එහි ඇමුණුම් කටු ආකර්ෂණය වී ඇති ආකාරය අඳින්න. (ලකුණු 02)

ii. වැඩිපුරම ඇමුණුම් කටු ආකර්ෂණය වී ඇති ප්‍රදේශ හඳුන්වන නම ලියන්න. (ලකුණු 01)

iii. පහත ද්‍රව්‍ය වලින් චුම්බකයට ආකර්ෂණය වන ද්‍රව්‍ය හා නොවන ද්‍රව්‍ය වෙන්කර වගුවේ සටහන් කරන්න.
පිත්තල ඇණ, ඉඳිකටුව, යකඩ ඇණ, තඹ කම්බි

| චුම්බකයට ආකර්ෂණය වන දෑ | චුම්බකයට ආකර්ෂණය නොවන දෑ |
|---|---|
| 1. | |
| 2. | |

(ලකුණු 02)


iv. පහත දක්වා ඇත්තේ චුම්බක පාඩම් ඇසුරෙන් කළ නිර්මාණයකි.




a. සමනලයා මල දෙසට ඇදී යාමට නම් B චුම්බකයේ ධ්‍රැව පිහිටන ආකාරය ලකුණු කරන්න. (ලකුණු 01)

b. එලෙස ඇදී යන්නේ ඇයි? (ලකුණු 01)

B. සිසුන් දෙදෙනෙකු විසින් කරන ලද ක්‍රියාකාරකමක් පහත දැක්වේ.




A සිසුවා විසින් කරන ලද ක්‍රියාකාරකම




B සිසුවා විසින් කරන ලද ක්‍රියාකාරකම

i. මෙම ක්‍රියාකාරකමේ භාවිතා කළ ආලෝක ප්‍රභවය කුමක්ද? (ලකුණු 01)

ii. A සිසුවාගේ හා B සිසුවාගේ නිරීක්ෂණ ලියන්න. (ලකුණු 02)

iii. ඉහත ආකාරයට නිරීක්ෂණය සිදුවන්නේ ආලෝකයේ කුමන ගුණය නිසා ද? (ලකුණු 01)

(මුළු ලකුණු 11)



CamScanner

07. A. පරිසරයෙන් අපට ඇසෙන ශබ්ද කිහිපයක් පහත දැක්වේ.

වයලීනයක හඬ, දිය ඇල්ලක ශබ්දය, කුරුලු නාද, වාහනයක නලා හඬ

i. ඉහත ශබ්ද අතරින්,

a. ස්වාභාවික ශබ්ද මොනවද? (ලකුණු 02)


b. කෘත්‍රිම ශබ්ද මොනවද? (ලකුණු 02)

ii. මිනිස් සිරුරේ පිහිටි ශබ්ද සඳහා සංවේදී ඉන්ද්‍රිය නම් කරන්න. (ලකුණු 01)

B. පහත දැක්වෙන, ශාක සම්බන්ධ දෙබෙදුම් සුවිය පිටපත් කරගෙන සම්පූර්ණ කරන්න

(a, b, c, d, e, f සඳහා සුදුසු පද යොදන්න.)

(ලකුණු 06)



සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade 06 | විෂයය / பாடம் / Subject: විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper I, II | පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 06. | 4 | 11. | 3 | 16. | 2 |
| 02. | 3 | 07. | 4 | 12. | 2 | 17. | 1 |
| 03. | 4 | 08. | 2 | 13. | 3 | 18. | 4 |
| 04. | 2 | 09. | 3 | 14. | 2 | 19. | 2 |
| 05. | 2 | 10. | 2 | 15. | 4 | 20. | 1 |


## II කොටස

01. A. i. ශාක ⟶ මාළුවා ⟶ කොකා
නිවැරදි ආහාර දාමය — ලකුණු 03
ii. ශාක — ලකුණු 01
iii. පාරිසරික සමතුලිත බව පවත්වා ගැනීම — ලකුණු 02
iv. a) මාළු, ඉස්ගෙඩි
b) ගෙම්බා, කොකා, පිළිහුඩුවා, දියබරියා — ලකුණු 03
c) කපුටා
v. ප්‍රභාසංස්ලේෂණය — ලකුණු 01

ii. ජල පහර (දිය පිහිල්ල) — ලකුණු 01
iii. මෝටරයක් — ලකුණු 01
iv. විදුලි බුබුල දැල්වීම මගින් — ලකුණු 01
v. ජල පහරේ වේගය වැඩි කිරීම /උස වැඩි කිරීම ආදි
vi. මන්නාරම, හම්බන්තොට, පුත්තලම — ලකුණු 02
ලකුණු 01
මුළු ලකුණු 16

2. A. i. තනුක සල්ෆියුරික් අම්ලය — ලකුණු 01
ii. තඹ (කොපර්) — ලකුණු 01
iii. සින්ක් තහඩුව දියවේ
කොපර් තහඩුව අසලින් වායු බුබුලු පිටවේ. — ලකුණු 02

3. i. — ලකුණු 04



ii. ධාරාව එකම දිශාවකට ගමන් කරවීම — ලකුණු 02
iii. B සිට A — ලකුණු 01

මුළු ලකුණු 11

03. A. i. තාප ශක්තිය — ලකුණු 01
ii. ශාක රසදිය කද ඉහළ යයි (රසදිය මට්ටම) — ලකුණු 02
iii. $100^0$ C — ලකුණු 01
iv. ද්‍රව වායු — ලකුණු 02

B i. ආදර්ශ සූර්ය ජල තාපකය — ලකුණු 01
ii. b — ලකුණු 02
iii. සූර්ය තාපය හොඳින් අවශෝෂණයට — ලකුණු 02

මුළු ලකුණු 11

04. A. i. අවර්ණ පොලිතීන් කොළය
ii. අඟුරු කැබැල්ල
iii. තඹ කම්බිය
iv. මල් සහිත පාට තෙල් කඩදාසි
v. බැලූනය
vi. පුළුන් — ලකුණු 06

B. i. පදාර්ථ
ii. ශක්ති
iii. ද්‍රව
iv. වායු
v. තාප ශක්තිය, ආලෝක ශක්තිය ආදි නිවැරදි ශක්ති විශේෂයන් — ලකුණු 05


මුළු ලකුණු 11

05. A. i. නිවැරදි ප්‍රස්තාරය — ලකුණු 03
ii. පෙ.ව. 7.30 — ලකුණු 01
iii. ප.ව. 1. 30 — ලකුණු 01
iv. 320 C - 250 C = 70 C — ලකුණු 01

B. i. C
ii. A — ලකුණු 03
iii. B — ලකුණු 01
iv. නැගෙනහිර සිට බටහිරට
v. mm — ලකුණු 01

මුළු ලකුණු 11

06. A. i.





ලකුණු 02

ii. චුම්බක ධ්‍රැව — ලකුණු 01

iii. චුම්බකයට ආකර්ශනය වන දෑ
ඉඳිකටුව, යකඩ ඇණ
චුම්බකයට ආකර්ශණය නොවන දෑ — ලකුණු 02
පිත්තල ඇණ, තඹ කම්බිය

iv. a) — ලකුණු 02




ලකුණු 01

b) විජාතීය චුම්බක ධ්‍රැව ආකර්ශණය නිසා — ලකුණු 01

B. i. ඉටි පන්දම — ලකුණු 01

ii. A සිසුවාට ඉටිපන්දම් දැල්ල පෙනේ

iii. ආලෝකය සරල රේඛීයව ගමන් කරන බව — ලකුණු 01

මුළු ලකුණු 11

07. A. i. a) ස්වාභාවික ශබ්ද - කුරුළු නාදය
- දිය ඇල්ලක ශබ්දය

b) කෘතිම ශබ්ද - වයලිනයක හඬ — ලකුණු 02
- වාහනයක නලා හඬ — ලකුණු 02

ii. කන — ලකුණු 01

a) a. මීවන ශාක

b) b. මිරිස් ගස

c. කොස්ගස

d. පොල් ගස

e. එලයේ කටු ඇත. — ලකුණු 06

f. මිරිස් — මුළු ලකුණු 11